පාර්ලිමේන්තු ප්‍රකාශන මලා අංක : 222

ආයතනයේ නම : කොළඹ මහා නගර සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා

සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ

හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 222

நிறுவனத்தின் பெயர் - கொழும்பு மாநகர சபை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக

நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும்

மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

**Parlimentary Series No: 222**

**Name of the Institution : Colombo Municipal Council**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No119(4)**

# රාජ්‍ය ගිණුම් කාරක සභාව - පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 222

## කොළඹ මහා නගර සභාව

| අනු අංකය | කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු | වත්මන් තත්ත්වය හා අඩුපාඩු නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 01 | කොළඹ මහා නගර සභාව තුළ බදු අයකිරීම 2000 වර්ෂයේ සිට පරිගණක පද්ධතියක් හරහා සිදු වූ බවත් ,2014 වර්ෂයේ සිට මාර්ගගත ක්‍රමයට ආදායම් එකතු කිරීම සිදු වූ බවත් මේ වන විට රුපියල් බිලියන 01 ක පමණ ආදායම් මාර්ගගත ක්‍රමයට රැස් කරන බවත් ග.නි ප්‍රකාශ කළාය<br>බදු ආදායම් රැස් කිරීම සඳහා Korea International Co-Operation Agency (KOICA) මූල්‍ය ආධාර යටතේ පද්ධතියක් ස්ථාපනය කිරීමට ඇමරිකානු ඩොලර් මිලියන 08 ක් ලැබුණු බව කොළඹ මහා නගර සභාවේ ග.නි කාරක සභාව හමුවේ ප්‍රකාශ කළාය. එම ව්‍යාපෘතිය යටතේ මුද්දර ආදායම්, වරිපනම් බදු, ව්‍යාපාර බදු ,ව්‍යාපාර බලපත්‍ර ආදායම යන ආදායම් මාර්ගගත ක්‍රමයට අය කිරීමට කටයුතු කරන බව ග.නි ප්‍රකාශ කළාය. | කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය (KOICA) විසින් කොළඹ මහා නගර සභාවේ ස්ථාපිත කිරීමට නියමිත ආදායම් එකතුකිරීමේ පද්ධති (Establish of IT Master Plan on Tax Administration and Implementation of E tax System for Colombo Municipal Council )<br>ව්‍යාපෘතියට අදාලව කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) සහ කොළඹ මහා නගර සභාව ,රාජ්‍ය පරිපාලන ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව 2025 ජුලි මස 03 වන දින එම ව්‍යාපෘතියට අදාළ එකඟතා ගිවිසුම (Record of Discussion) අත්සන් තබන ලදී.<br>එසේම මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු KOICA ආයතනය කොළඹ මහා නගර සභාවට පැමිණීමෙන් පසු සිදු කිරීමට නියමිතව ඇති බව දන්වමි. |
| 02 | පළාත් පාලන ආයතන විසින් උසාවි දඩ මුදල් අය කිරීමේ දී එම දඩ මුදල් ලේඛන පරීක්ෂා කර සටහන් කර ගන්නා බවත් පසුව එම උසාවි දඩ මුදල අධිකරණය විසින් සහතික කර දුන් පසු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා බවත් ග.නි ප්‍රකාශ කළාය.<br>උසාවි දඩ මුදල් සෘජුව පළාත් පාලන ආයතන වලට ලබා දීමට විධිමත් ක්‍රමවේදයක් නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර,රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය ,අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය හා පළාත් සභාවල පළාත් පාලන අමාත්‍යංශය ඒකාබද්ධ කර පළාත් පාලන අයතන වල වරිපනම් /දඩ මුදල් /මුද්දර ගාස්තු වැනි බදු ආදායම් ගණනය කිරීමට සෘජු ක්‍රමවේදයක් සකස් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නිර්දේශ කළේය. | කොළඹ මහා නගර සභාවේ නිළධාරීන් විසින් කොළඹ මහා නගර සභාවට අයත් උසාවි වන මාලිගාකන්ද , කොටුව හා අළුත්කඩේ යන ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ වෙත ගොස් උපලේඛණ පිළියෙල කරනු ලබයි .එම උපලේඛණ පිළියෙල කර පලාත් ආදායම් දෙපාර්තමේන්තුවට යොමු කරන අතර ඉන්පසු එම උපලේඛණ වලට අදාල මුදල් අප කාර්යාලය වෙත පළාත් සභාව විසින් ප්‍රේෂණය කරනු ලබයි.<br>වර්තමානයේ ද මෙම ක්‍රමවේදය මේ ආකාරයෙන්ම ක්‍රියාත්මක වන අතර උසාවි දඩ මුදල් සෘජුව පළාත් පාලන ආයතන වලට විධිමත්ව ලබා දීමට ක්‍රමවේදයන් සඳහා මැදිහත් විය යුතු ආයතන ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් හදුනාගෙන ඇති, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය,අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය සහ පළාත් සභාවල පළාත් පාලන අමාත්‍යංශය ඒකාබද්ධ කර සෘජු ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ මූලිකත්වයෙන් සිදු කිරීම වඩාත් සුදුසු බව |

| | | |
|---|---|---|
| | ඒ අනුව මීළඟ රැස්වීමට අධිකරණ ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන ලෙසද කාරක සභාව මූලික තාක්ෂණික කමිටුවට නිර්දේශ කළ අතර, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඒ සම්බන්ධයෙන් අධිකරණ ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය දැනුවත් කරන බවද අවධාරණය කළේය. | යෝජනා කරමි . |

පාලිත නානායක්කාර
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව

දුරකථන අංකය -0112699316

ෆැක්ස් අංකය - 0112699316

විද්‍යුත් ලිපිනය - ma175@colombo.mc.gov.lk